# පෙර භවයක එක් දිනක් අනිත්‍ය භාවනාව වඩා සත් හැවිරිදි වියේ දී අරහත්වයට පත් වූ මහරහතන් වහන්සේ

අපි ජීවත් වෙන මේ වර්ථමාන සමාජය අසත්පුරුෂයන් ගෙන් පිරුණු එකක්. බුදු රජාණන් වහන්සේට මල් පහන් පූජා කිරීමේ පටන්, අනිත්‍යාදී භාවනාවන් වැඩීම දක්වා ම ඒවාට ගර්හා කරන පිරිස් ඕන තරම් ඉන්නවා. අති උත්තම දළදා හාමුදුරුවන් වහන්සේට ත් ගර්හා කරල පළ කරපු ලිපි කිහිපයක් ම අන්තර්ජාලයේ දී මට හමු වුනා...

නමුත් බලන්න අනන්ත ගුණ දරා සිට බුදු රජාණන් වහන්සේට මල් පූජා කිරීමේ ත්, අනිත්‍ය සඤ්ඤාව වැඩීමේත් විපාක කෙතරම් නම් අසිරිමත් ද කියා...

*මේ ගාථාවන් ප්‍රකාශ කළේ සෝපාක නම් වූ මහරහතන් වහන්සේ යි.*

01. වනයේ සොඳුරු පර්වතයක ගුහාවක් පිරිසිදු කරන්නා වූ මා වෙත සිද්ධාර්ථ නම් වූ භාග්‍යවතුන් වහන්සේ පැමිණි සේක.

02. මම එසේ පැමිණි බුදු රජාණන් වහන්සේ දැක, තාදි ගුණ ඇති, ලෝක ජේෂ්ඨ වූ ශාස්තෘන් වහන්සේ ට ඇතිරිල්ලක් අතුරා මල් ආසනයක් තනා දුනිමි.

03. සිද්ධාර්ථ බුදු රජාණන් වහන්සේ මල් ආසනයේ වැඩ හිඳ මාගේ මතු උප්පත්ති ස්ථානය ද දැන ගෙන අනිත්‍ය භාවය ගැන මෙසේ වදාළ සේක.

04. “ඒකාන්තයෙන් ම සංස්කාර අනිත්‍ය යි. ඉපදීම හා විනාශය ස්වභාවය කොටගෙන පවතියි. ඉපදී නැති වී යයි. ඒ සංස්කාරයන් ගේ සංසිඳීම සැපයකි.”

05. ලෝක ජේෂ්ඨ වූ මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ වූ මහා ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ මෙය වදාරා අහසේ යන හංසරාජයෙකු සේ අහසට පැනනැංගේ ය.

06. මම මා අදහමින් සිටි ආගම අතහැර දමා අනිත්‍ය සඤ්ඤාව වැඩීමි. එක් දිනක් පමණක් භාවනා කොට මිය පරලොව ගියෙමි.

07. කුසල් මුල් වලින් මෙහෙයවන ලැබූ මම දිව්‍ය මානුෂ සම්පත් අනුභව කොට අන්තිම භවයේ දි සපාක නම් කුලයේ උපත ලැබුවෙමි.

08. ගිහි ගෙදරින් නික්මී නිවෙස් නො මැති සසුනේ පැවිදි වීමි. උපතින් සත්හැවිරිදි වියේ දි මම රහත් භාවයට පත් වීමි.

09. මම පටන් ගත් වීර්යයෙන් යුක්ත වී, නිවනට මෙහෙයවන ලද සිතින් යුක්ත වී ඉතා හොඳින් සීලයන් තුළ හික්මී බුදු රජාණන් වහන්සේ සතුටට පත් කොට උපසම්පදාව ලබා ගතිමි.

10. මෙයින් 94 වැනි කල්පයේ (මල් ආසනයක් සදා දීම් වශයෙන්) යම් කර්මයක් කරන ලද ද එහි විපාක වශයෙන් එතැන් සිට දුගතියකට නො ගියෙමි. මෙය මල් පූජා කිරීමේ විපාකය යි.

11. මෙයින් 94 වැනි කල්පයේ යම් අනිත්‍ය සඤ්ඤාවක් වැඩුයෙමි ද, ඒ අනිත්‍ය සඤ්ඤාව ම වඩන්නා වූ මා තුළ පැවති සියලු කෙලෙසුන් (ආශ්‍රව) ක්ෂය වී ගියේ ය.

12. **සතර පටිසම්භිදා ද, අෂ්ඨ විමෝක්ෂයෝ ද, අභිඥා සය ද සාක්ෂාත් කරන ලදි. බුදු රජාණන් වහන්සේ ගේ සම්බුදු සසුන තුළ කළ යුතු දේ සිදු කරන ලදි.**

*මේ ආකාරයට ආයුෂ්මත් සෝපාක නම් වූ මහරහතන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේක.*

අනිත්‍ය සඤ්ඤාව වැඩීම පිළිබඳව භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ මෙසේ දේශනා කොට වදාළා.

*"සෙය්‍යථාපි භික්ඛවේ සරදසමයේ විද්ධේ විගතවලාහකේ දේවේ ආදිච්චෝ නභං අබ්භුස්සුක්කමානෝ, සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතේ ච තපතේ ච විරෝචතේ ච. ඒවමේව ඛෝ භික්ඛවේ, අනිච්චසඤ්ඤා භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති. සබ්බං අවිජ්ජං පරියාදියති. සබ්බං අස්මිමානං සමූහනති."*

**"මහණෙනි, සරත් සමයේ වලාකුළු නැති අහසේ හිරු මඬල නැගී එද්දී, අහසේ පැතිර තිබෙන සියලු අඳුර මැඬලමින් හිරු බබළයි ද, දිදුලයි ද, රැස් විහිදයි ද, එසේ ම මහණෙනි, අනිත්‍ය සඤ්ඤාව වැඩූ කල්හි බහුල වශයෙන් වැඩූ කල්හි සියලු කාමරාගය මැඩ පවත්වයි. සියලු රූපරාගය මැඩ පවත්වයි. සියලු භවරාගය මැඩ පවත්වයි. සියලු අවිද්‍යාව මැඩ පවත්වයි. සියලු අස්මිමානය නසා දමයි."**

*(සංයුත්ත නිකාය - 3)*

කල්ප ගණනකට පෙර එක් දිනක් අනිත්‍ය සඤ්ඤාව වැඩීමෙන් සෝපාක රහතන් වහන්සේ අත් කරගත් ප්‍රතිඵලය දැන් අපි දන්නවා. සෑම දිනක ම විනාඩි කිහිපයක් හෝ අනිත්‍ය සඤ්ඤාව වඩන්නට අපට හැකි වුවහොත් අපිට කෙතරම් නම් ප්‍රතිඵලයක් අත් වෙයි ද,.....එම නිසා අපිත් නිරන්තරයෙන් අනිත්‍ය සඤ්ඤාව පුරුදු කරමු...

**සාදු ! සාදු !! සාදු !!!**



**DhammaMedicine**

Namo Buddhaya !!!
This is the only path;
there is none other for
the purification of insight !

Visit this Google Group
Click2Comment | Discussions |



**Drink Dhamma medicine to get rid of all stresses**